# මාධ්‍ය නිවේදනයයි

2008-09-15

Visit our web site

www.tisrilanka.org

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
Building a Nation of integrity

28/1, Bullers Lane, Colombo 07
Tel/Fax: 0112-501474, 0112-592287
Email: tisl@sltnet.lk
Web: http://www.tisrilanka.org

මේ සමඟ අමුණා ඇත්තේ අයවැය ඇස්තමේන්තු පරීක්ෂා කිරීමේ කමිටුවක් පත් කිරීමට ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධාන වරයා විසින් යෝජනා කර ඇති ක්‍රියාමාර්ගය සම්බන්ධව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ පුවත්පත් නිවේදනයයි.

මේ සඳහා ඉක්මන් ප්‍රචාරයක් බලාපොරොත්තු වෙමි.

ජේ.සී. වැලිඅමුණ,
විධායක අධ්‍යක්ෂක.

---

## ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක වරයාගේ යෝජනාව අභිමත කරයි.

අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී සහ අපේක්ෂිත ඉලක්ක ළඟා කරගැනීමේ ක්‍රියාවලියේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරු මීට වඩා ක්‍රියාශීලීව දයක විය යුතු බවට ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධාන අමාත්‍යය දිනේෂ් ගුණවර්ධන මහතා විසින් කර ඇති ප්‍රකාශය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් පැසසීමට ලක්කොට ඇත.

"ශ්‍රී ලංකාවේ අයවැය ක්‍රියාදමය ඉතා දුර්වල වන අතර එහි අන්තර්ගතයත් ක්‍රියාදමයත් රහස්‍යභාවයෙන් පිරි එකක් බව පෙනේ. මීට පෙර අවස්ථා කිහිපයකදීම අප පෙන්වා දී ඇති පරිදි අයවැය වඩාත් විනිවිදභාවයෙන් යුක්ත විය යුතු අතර එමගින් ම අයවැය වඩාත් කාර්යක්ෂම හා වගවිය යුතු ක්‍රියාවලියක් බවට පත් වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළට ප්‍රබල අයවැය කමිටුවක අවශ්‍යතාවය යෝජනා කර ඇතැයි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂක ජේ.සී. වැලිඅමුණ මහතා කියා සිටියි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය තවදුරටත් ප්‍රකාශකර සිටින්නේ අයවැය ක්‍රියාදාමය හා ඇස්තමේන්තු වල යථාර්ථවාදීභාවය පරීක්ෂා කරනු සඳහා බොහෝ රටවල පාර්ලිමේන්තුව තුල ඒ සඳහාම වෙන් වූ අයවැය හෝ මූල්‍ය කමිටුවක් පවතින බවයි. එම පසුබිම තුළ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක වරයාගේ යෝජිත පියවරයන්ට සහයෝගය පළ කරන ලෙස පාර්ලිමේන්තුව නියෝජනය කරන සියළුම පක්ෂ වලින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ඉල්ලා සිටියි.

ජනතා විමුක්ති පෙරමුණු කණ්ඩායමේ නායක අනුර කුමාර දිසානායක මන්ත්‍රීවරයාට පිළිතුරු දෙමින් අමාත්‍ය ගුණවර්ධන මහතා පෙන්වා දී ඇත්තේ රාජ්‍ය මූල්‍ය පිළිබඳව පූර්ණ බලතල පාර්ලිමේන්තුවට ඇති බවත් එම බලතල පාර්ලිමේන්තුව මගින් ක්‍රියාත්මක කළ යුතු බවත්ය. විපක්ෂ ප්‍රධාන සංවිධායක ජෝසප් මයිකල් පෙරේරා මහතා විසින්ද එම යෝජනාවට ප්‍රතිපත්තිමය වශයෙන් එකඟත්වය පළ කොට ඇත. මෙම කාරණය මීළඟ පක්ෂ නායක රැස්වීමේදී සාකච්ඡාවට බඳුන් කිරීමට නියමිතය.